Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය-භූගෝල විද්‍යාව

සතිය- 6

ශ්‍රේණිය-12

සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය,රත්නපුර.

නිපුණතාව 3.0 – මූලික ජනාවාස හඳුනා ගනිමින් ඒවායේ ගති ලක්ෂණ පැහැදිලි කරයි.

නිපුණතා මට්ටම 3.1 - ජනාවාසයක මූලිකාංග,වර්ග හා රටා පැහැදිලි කරයි.

ජනාවාසයක් යනු - නිවාස,ගොඩනැගිලි පමණක් නොව වැටවල්,මාර්ග,ගබඩා,ගොවිපළවල් ආදී සියල්ලක්ම ඇතුළත්ව,මිනිසා විසින් ප්‍රයෝජනයට ගනු ලබන සියලු දෙයින් ද විවිධත්වයක් ඇති පුද්ගලයන් සමූහයකින් ද සමන්විත වූවකි.

ජනාවාසයක මූලිකාංග

1. මිනිසා - ජනාවාසයක ප්‍රධානම සංරචකයයි.ජනාවාස ගොඩනගන්නේ මිනිසාය.
2. ආවරණ - නිවාස හා ගොඩනැගිලි
3. ජාල - තවත් ප්‍රදේශ හා සම්බන්ධතා පවත්වන මාර්ග හා විදුලි සංදේශ රැහැන් වැනි සන්නිවේදන ජාල
4. ස්වාභාවික පරිසරය - ජනාවාසයකට පදනම වන භෞතික පරිසරය
5. සමාජය - ඉහත සාධක සියල්ල එක් ව ජනාවාසය තුළ ගොඩනැගෙන්නේ සමාජ පරිසරයයි.

<u>අභ්‍යාස</u>

1.ශ්‍රී ලංකාවේ විවිධ ග්‍රාමීය ජනාවාස වර්ගීකරණය කරන්න.

2.එම ජනාවාස 4ක් දක්වා ඒවායේ ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න.

3.ලෝකයේ විවිධ ග්‍රාමීය ජනාවාස උදාහරණ සහිතව විස්තර කරන්න.